සියලු හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

09 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2019 | 15 S

ඉස්ලාම් | කාලය පැය දෙකයි

නම හා විභාග අංකයඃ-..............................................................................................................................

**උපදෙස් ඃ-** • I කොටසේ ඇති සියළුම ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.
II කොටසේ පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න හතරකටත් වශයෙන් තෝරා ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

I කොටස

01. අල්ලාහ්ගේ අලංකාර නාම වලින් "අල් අහද්" හි අර්ථය,
i. අසමසම කරුණාවන්තයා ii. අධිපතියා iii. ඒකයා iv. ශක්තිවන්තයා

02. මරණයට පත් වූ සියල්ල යළි පණ දී යළි නැගිට වනු ලැබීම හඳුන්වන පදය,
i. බඃස් ii. මඃෂර් iii. හිසාබ් iv. මීසාන්

03. කලා කද්ර් පිළිබඳ විශ්වාසය ඉස්ලාමීය අකීදාවේ කුමන කොටසේ අන්තර්ගත වී ඇත්තේද?
i. අල් ඉලාහිය්යාත් ii. අන්නුබුවාත් iii. අස්සම්ඉය්යාත් iv. අර්රූහානියාත්

04. හජ් වගකීම අනිවාර්යය වූයේ හිජ්රි වසර,
i. 2 ii. 4 iii. 6 iv. 9

05. අල්කුර්ආනය පාරායණය කිරීමේදී මුස්ලිම්වරු අතර බෙදීම් ඇති වීම වැලැක්වීමේ අවශ්‍යතාවය ගෙන හැර දැක්වූ නබි මිතුරා,
i. උමර් ඉබ්නු කත්තාබ් (රලි) ii. හුදෙෆා ඉබ්නු යමානි (රලි)
iii. අබ්දුල්ලාහ් ඉබ්නු අබ්බාස් (රලි) iv. අලි ඉබ්නු අබී තාලිබ් (රලි)

06. පහත සඳහන් දේ අතුරින් හදීස් ග්‍රන්ථ වර්ගයක් නොවන්නේ,
i. මුස්නද් ii. මුසන්නෆ් iii. මුස්හබ් iv. ජාමිඋ

07. මහබ්බතුර් රසූල් යන්නෙහි අර්ථය කුමක්ද?
i. නබි (සල්) තුමා විශ්වාස කිරීම ii. නබි (සල්) තුමා අනුගමනය කිරීම
iii. නබි (සල්) තුමා කෙරෙහි දක්වන ආදරය iv. මුහම්මද් (සල්) තුමා අවසාන නබිවරයාය

08. මූසා (අලෛ) සලාම් හා සම්බන්ධ ඉතිහාස ගත ස්ථානයකි,
i. දික්රිද් ii. මවුසිල් iii. සිනායි iv. යෙමන්

09. නබි (සල්) තුමාගේ බිරින්දෑ වරුන්ගෙන් අධික වශයෙන් දාන මාන සිදු කළ බැවින් දිගු අතැත්තිය යැයි නබි (සල්) තුමා අගය කරනු ලැබුවේ,
i. සෛනත් බින් හුසෛමා (රලි) ii. මෛමූනා (රලි)
iii. උම්මු හබීබා (රලි) iv. සෛනබ් බින්ත් ජහ්ෂ් (රලි)

10. මගියෙකු මඃරිබ් සලාතය ඉෂා වේලාවේ දී ඉටු කිරීම,
i. කස්රු ii. ජම්උ iii. ජම්උ තක්දීම් iv. ජම්උත් තඃසීර්

11. ජනාසා සලාතයේ දෙවන තක්බීරය සමඟ,
i. සූරතුල් ෆාතිහා පාරායණය කළ යුතුය. ii. නබි (සල්) තුමා කෙරෙහි සලාවත් පැවසිය යුතුය
iii. ජනාසාව වෙනුවෙන් ප්‍රාර්ථනා කළ යුතුය iv. අල්කුර්ආනයේ ඕනෑම සූරාවක් පාරායණය කළ යුතුය

12. කොන්ස්තන්තිනෝපලය ජයගත් මුස්ලිම් සෙබළුන්ට නායකත්වය දුන්නේ,
i. සලාහුද්දීන් අයියූබ් ii. ඉමාදුද්දීන් සංගී iii. මුහම්මදු අල් ෆාතිහ් iv. සේනාධිපති අසදුද්දීන්

13. නබි (සල්) තුමා "මදීනා සම්මුතිය" යන ගිවිසුම ඇති කර ගත්තේ,
i. යුදෙව්වන් සමඟ ii. ක්‍රිස්තියානිවරුන් සමඟ iii. කුරෙෂිවරුන් සමඟ iv. සහාභාගවරුන් සමඟ

14. බනූ ඉස්රාඊල් සමූහයට එවනු ලැබූ නබිවරයා,
i. ඉබ්රාහීම් (අලෛ) ii. හූද් (අලෛ) iii. නූහ් (අලෛ) iv. මූසා (අලෛ)

15. පහත සඳහන් දේවල් අතුරින් හජ් හි ෆර්ලු නොවන්නේ,
i. නීය්යත් තැබීම ii. අරෆාවෙහි රැඳීම iii. මිනාවේ රැඳීම iv. සඊයු කිරීම

16. සූරතුල් ලුහා හි අඩංගු ආයත් ගණන,
i. 9 ii. 11 iii. 13 iv. 15

17. සහීහ් මුස්ලිම් හි අඩංගු හදීස් ගණන,
i. 4000 ii. 4800 iii. 5000 iv. 7225

18. නබි (සල්) තුමා හජ් ඉටු කිරීම සඳහා ගිය විට මදීනාවේ භාරකරු ලෙස පත් කළ නබි මිතුරා,
i. අබූ හුරෛරා (රලි) ii. අබූ තුජානා (රලි) iii. සෛද් බින් තාසිනා (රලි) iv. සෛද් ඉබ්නු සාබිත් (රලි)

19. රත්තරං සඳහා zසකාත් අනිවාර්‍යය වන අවම ප්‍රමාණය,
i. ග්රෑම් 85 ii. ග්රෑම් 100 iii. ග්රෑම් 110 iv. ග්රෑම් 210

20. අල්ලාහ් මධ්‍යස්ථභාවයෙන් යුතුව විසඳුම් ලබා දීම හඳුන්වන පදය,
i. සිෆත් ii. කුද්රත් iii. ඉරාදත් iv. අද්ල්

## II කොටස

01. කෙටි පිළිතුරු සපයන්න.
i. අල්කුර්ආනය ග්‍රන්ථාරූඪ කිරීමට බලපෑ යුද්ධයේ නම කුමක්ද?
ii. දුල්හජ් මස අටවන දින හඳුන්වන්නේ කෙසේද?
iii. ඊසා (අලෛ) තුමාගේ ආරාධනය පළමුවෙන් පිළිගත් මිතුරන් කෙසේ හැඳින්වූයේද?
iv. උම්මාහතුල් මුඃමිනීන්වරුන්ගෙන් "උම්මුල් මසාකීන්" යනුවෙන් හැඳින්වූයේ කවුද?
v. ස්වර්ගය අමතනු ලබන වෙනත් නම් හතරක් ලියන්න.
vi. සහීහ් බුහාරි, සහීහ් මුස්ලිම් යන ග්‍රන්ථ දෙකෙහි එකම අයුරින් සඳහන් වී ඇති හදීස් කෙසේ හඳුන්වන්නේද?
vii. "ජාමිඋල් කුර්ආන්" යන විශේෂ නාමයෙන් අමතනු ලැබූ සහාබිවරයා කවුද?
viii. මස්ජිදයකට ඇතුළු වූ වහාම මස්ජිදයට පඬුරක් වශයෙන් කෙනෙකු විසින් ඉටු කරනු ලබන සුන්නත් සලාතය කුමක්ද?
ix. හජ් ඉටු කරනු ලබන ක්‍රම අතුරින් "අල්කිරාන්" යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?
x. නිරයේ වැසියන් හට ආහාරය වශයෙන් දෙනු ලබන්නේ කුමක්ද?

02. i. හදීස් එක්රැස් කිරීමට නිල වශයෙන් අවසර ලබා දුන් කලීෆාවරයා කවුද?
ii. හදීස් ආරක්ෂා කිරීමේ ලා නබි මිතුරන්ගේ දායකත්වය සඳහන් කරන්න.
iii. හදීස් ක්ෂේත්‍රයට ඉමාම් බුහාරි (රහ්) දැක්වූ දායකත්වය කුමක්ද?

03. i. මූසා (අලෛ) ළදරුවෙකුව සිටියදී ඔහුව ෆිර්අවුන්ගේ මාළිගාවේ හදා වඩා ගත් ස්ත්‍රිය කවුද?
ii. ඊසා (අලෛ)ට පිරිනමන ලද විශ්මිතයන් තුනක් ලියන්න.
iii. ඉස්ලාමයේ ජයග්‍රහණයට උම්මාහතුල් මුඃමිනීන්වරුන්ගේ දායකත්වයන් හතරක් ලියන්න.

04. i. ජල සම්පත නාස්තිවීම වළකා ගත හැකි ආකාර දෙකක් ලියන්න.
ii. නාස්තිය පවකි. යන්නට මූලාශ්‍ර සාධකයන් සපයන්න.
iii. යූසුෆ් (අලෛ) තුමාගේ කාලයේ හට ගත් ආහාර හිඟයට එතුමා විසඳුම් ලබා ගත්තේ කෙසේද?

05. i. අල්ලාහ් විසින් තහනම් කර ඇති දේ වලින් හැසිරීම හා සම්බන්ධ තහනම් හතරක් ලියන්න.
ii. ජාතීන් අතර සමගිය රැකිය හැකි ක්‍රම තුනක් ලියන්න.
iii. අන්‍ය ආගම් වලට ගරු කිරීම පිළිබඳ අල්කුර්ආන් වැකියක් හා හදීසයක් ලියන්න.

06. i. කලා කද්ර් පිළිබඳ විශ්වාසයෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.
ii. ජුම් ආ දිනයේ දී පිළිපැදිය යුතු අංග මොනවාද?
iii. zසකාත් අනිවාර්‍යය වන ද්‍රව්‍ය මොනවාද?

07. i. පහත මාතෘකා අතුරින් මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
i. අදාබුල් මස්ජිද්
ii. හජ්ජතුල් විදා
iii. සුල්තාන් මුහම්මදු අල් ෆාතිහ්
iv. දේශාභිමානය